# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 47 — 1973 පෙබරවාරි 15 වැනි බ්‍රහස්පතින්ද — 1973.02.15

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 229 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 231 | අය-වැය ලේඛන ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 234 | දේපල විකිණීම ... ... ... | 236 |
| අකුරු ව්‍යවස්ථා ... ... ... | 236 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනක යටතේ දැන්වීම් ... | — | විවිධ දැන්වීම් ... ... ... | 237 |


**සැලකිය යුතුයි.**—පොදු පහසුකම් මණ්ඩල පනත් කෙටුම්පත සහ බද්ධ නිවාස අයිතිකම් පනත් කෙටුම්පත 1973 පෙබරවාරි 02 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

## පළාත් පාලන නිවේදන

එල්ජීඩී/සී/4(යූ)/5.

**නගර සභා ආඥාපනත**

184 වන වගන්තිය යටතේ ආඥාව

1968 අංක 42 දරන පනතින් සංශෝධනය කරන ලද (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 184 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම ඉහත කී වගන්තිය යටතේ හලාවත නගරය සම්බන්ධයෙන් පනවනු ලැබ, 1970 අගෝස්තු මස 19 වැනි දින අංක 14,919/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1972 ජනවාරි 1 වැනි දින අංක 14,991/10 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝගයේ සංශෝධිත ආඥාව එහි අවසාන ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් 1973 පෙබරවාරි මස 10 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවතත් මෙයින් සංශෝධනය කරමි:—

"(ආ) ඒ නගරය සඳහා එකී ආඥාපනත යටතේ අලුත් නගර සභාවක්, සංස්ථාපනය කරගන්නා තුරු, හලාවත නගරයේ කටයුතු පාලනය කිරීම පිණිසද, ඒ කාර්යය සඳහා එකී ආඥාපනත යටතේ නගර සභාවක බලතල ක්‍රියාවෙහි යෙදවීම සහ යුතුකම් ඉටු කිරීම පිණිසද, විශේෂ කොමසාරිස් වරයා වශයෙන් පානදුර, පිංවත්ත, අංක 101 හි, ඇම්. බී. ද සොයිසා ගුණතිලක රාජපක්ෂ මහතා පත් කරමි."

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1973 ජනවාරි 31 වැනි දින,
කොළඹදීය.

02-680—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

### රුවන්වැල්ල සුළු නගර සභාව

විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ රුවන්වැල්ල සුළු නගර සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව එම වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කරනු ලැබේ.

**යෝජනාව**

"(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මේ සභාව විසින් සභාවේ පරිපාලන සීමාව ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (එම ආඥාපනතේ විස්තර කර ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කරනු ලබන සියළුම ගෙවීම්වලින් සියයට විස්සක බද්දක්, 1966 මැයි 6 වැනි දින අංක 14,694 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුති යෝජනාව මගින් එවැනි ගෙවීම් වෙනුවෙන් පනවා අය කරන ලද බද්ද වෙනුවට මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දින සිට මෙයින් පනවා අය කරනු ලැබේ."

ජී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ
අතිරේක ලේකම්.

1973 ජනවාරි මස 26 වැනි දින,
කොළඹ දී ය.

02–692—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### නිවැරදි කිරීම

විල්ගමුව ගම්සභාව

1972. 12. 22 වෙනි දින අංක 39 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ 754 වෙනි පිටුවෙහි ප්‍රසිද්ධ කරන ලද 72. 12. 2 දතමින් යුත් ගම්සභා ආඥාපනතේ 8 වැනි වගන්තිය යටතේ වූ නිවේදනයේ දෙවන උපලේඛනයේ II තීරයේ ඡන්ද කොට්ඨාශ අංක 3 හි "සෝනුක්ත සහ යාය 80" "සෝනුත්ත ගම සහ යාය 80" යනුවෙන් ද, ඡන්ද කොට්ඨාශ "අංක 14 හි කරව්ගහවැව සහ 12/2 යායෙන්" "කරව්ගහවැව ගම සහ 12/2 යායෙන්" යනුවෙන් ද, ඡන්ද කොට්ඨාශ අංක 15 හි "ලේඛියන්ගල" "ලේඛියත්ගල" යනුවෙන් ද එම් උපලේඛනයේ පළමු වැනි තීරයේ "අංක හ 395—විල්ගමුව" "අංක ඊ 395 විල්ගමුව" යනුවෙන් ද නිවැරදි විය යුතුය.

02–755—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### නාත්තන්ඩිය සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

**1973 වර්ෂය සඳහා වූ විශේෂ කසළ ශෝධන බද්ද**

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ නාත්තන්ඩිය සුළු නගර සභාව විසින් අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම් වලට යටත්ව නාත්තන්ඩිය සුළු නගර සභාවේ අංක 2, 3, 4 හා 7 යන ඡන්ද කොට්ඨාශ තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හතර බැගින් වූ විශේෂ කසළ ශෝධන බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හිදී සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමැතිය ඇතිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 පෙබරවාරි මස 05 වැනි දින,
කොළඹ දී ය.

02–691—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ වූ දැන්වීම

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 13 (1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මාතර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් පල්ලෙවෙල බදනසිංහ විල්සන් වන මම, මාතර දිස්ත්‍රික්කයේ අපරැක්ක—බඹරැන්ද ගම්සභාවේ අංක 5 දරණ බැද්දගම්මැද්ද කොට්ඨාශයේ සභික සේවා කොකාවලගේ සිරිසේන මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත් කර ගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, මාතර දිස්ත්‍රික්කයේ අපරැක්ක-බඹරැන්ද ගම්සභාවේ අංක 5 දරණ කොට්ඨාශයේ සභික සේවා කොකාවලගේ සිරිසේන මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

පී. බී. විල්සන්,
මාතර පළාත් පාලන සහකාර කොමසාරිස්.

1973.02.05 වැනි දින,
මාතර, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේදීය.

02–695—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධිත) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර, මහනුවර දිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස්, මුතු බණ්ඩාර සමරකෝන්, වන මම, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර කඳුපලාත ගම්සභාවේ අංක 14 දරණ කොට්ඨාශයේ සභික, ටී. බී. අලහකෝන් මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර කඳුපලාත ගම්සභාවේ අංක 14 දරණ කොට්ඨාශයේ සභික ටී. බී. අලහකෝන් මහතා, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට සාමාජිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. බී. සමරකෝන්,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මහනුවර දිස්ත්‍රික්කය.

1973 පෙබරවාරි මස 2,
මහනුවර, පළාත් පාලන කාර්යාලයේදීය.

02–697—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදාල නොවේ.)

සටහන.—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය තනතුරු ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලැබේ.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදාල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

5. සෑම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි

6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළත්ව පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එයේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිය නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. වයස පිළිබඳ අනුග්‍රහය.—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළකෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම් කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදවන්නට තමන් සූදානමව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයනට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට මේ තැනැත්තකුට වුවමනා නම්, එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයක් ලබාගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ කුමුම ඒ අවදානමට මුහුණ පාති.

අභ්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පත් ආකෘතිය

## පළාත් පාලන සේවය

සැ.යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවන් වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවන් ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය. (2) චරිත සහතිකය. (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

——————තනතුර සඳහා වූ අයදුම් පත

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
(ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
ජාතිය :————
(එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)

3. කැපැල් ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4 (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස :—.
අවුරුදු :————, මාස :————, දින :————
(ආ) උපන් දිනය :—.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඇ) පිරවිය යුතුය.)

6. විවාහකද? අවිවාහකද? වැන්දඹුද? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—.

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)

| සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ඨ සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලටන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක්ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :—— ——.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

සහායක කම්බිකරු—කටාන ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය : වර්ෂයකට රු. 504—30×8—744 (ඒකාබද්ධ රුපි. 2154—54×8—2586) ක් වේ.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) 1973. 03. 01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 35 ට නොවැඩි විය යුතුයි.

(ආ) අයදුම්කරුවන් අඩු වශයෙන් සිංහල 7 වැනි ප්‍රමාණය සමත් වී සිටිය යුතුයි.

(ඇ) අයදුම්කරුවන් ලංකා කාර්මික විද්‍යාලයේ විදුලිය කම්බි ඇදීම පිළිබඳ පාඨමාලාව හෝ විදුලි කම්බි ඇදීම පිළිබඳ කම්කරු දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන පාඨමාලාව හෝ සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇති අය විය යුතුයි. නැතහොත් අයදුම්කරුවෝ පළාත් පාලන ආයතනයක හෝ ආණ්ඩුවේ ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක විදුලි සේවා කටයුතුවල යටත් පිරිසෙයින් අවුරුදු හයක (6) පළපුරුද්දක් ඇතිව සිටිය යුතුයි.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි ස්ථිර සේවකයන්ගේ අයදුම් පත් ඔවුන් අන්‍ය සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොතකා සලකා බැලීම පිණිස ඔවුන්ගේ ප්‍රාදේශීය බලමණ්ඩල ප්‍රධානීන් මගින් එවිය හැකිය.

5. මෙම ගැසට් පත්‍රයේ IV කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්, පත් කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයක් අනුව සාරානුකූලව පිළියෙලකොට 1973. 03. 01 දින ප. ව. 2. 30 ට පෙර මාවෙත ලැබෙන සේ ලියාපදිංචිකළ තැපෑලෙන් එවිය යුතුය.

සී. ජේ. ප්‍රනාන්දු පුල්ලේ,
කටාන ගම්සභාවේ සභාපති.

1973. 01. 05 දින,
කටාන ගම්සභා කාර්යාලයේ දී ය.

2–775—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**පළාත් පාලන සේවය**

ඖෂධවේදී සහ හෙදි පරිපාලිකා තනතුරු

අංක 42 හා 1973. 01. 12 වැනි දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ පළ කරන ලද ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනය 1973 මාර්තු මස 15 වැනි දින වනතෙක් දීර්ඝකර ඇත.

1973 පෙබරවාරි මස 12 දින,
තැ. පෙ. 530,
කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

**2–793—73,02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය**

---

**මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර උඩගම්පහ දකුණු ගම්සභාව**

පුස්තකාල භාරකාර තනතුර

ඉහත නම් සඳහන් ගම්සභාවේ පුස්තකාල භාරකාර තනතුර සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. **වාර්ෂික වැටුප් ක්‍රමය.**—රු. 504—30—744 යන වැටුප් ක්‍රමයට අනුව වැටුප් ගෙවනු ලැබේ.

3. තනතුර ස්ථිරය. අර්ථසාධක අරමුදලට හිමිකම් ඇත. මෙම පත්වීම අවුරුදු දෙකක ආධුනික කාලයකින් පසු ස්ථිරවේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—

(1) ඉල්ලුම්කරු ලාංකිකයෙකු විය යුතු අතරම පාතදුම්බර උඩගම්පහ දකුණු ගම්සභා සීමාවතුල 1973. 2. 28 වැනි දිනට අවුරුදු පහකට නොඅඩු කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයෙකු වියයුතුයි.

(2) 1973. 2. 28 වෙනි දිනට වයස අවුරුදු දහඅටට නොඅඩු හා විසිපහට නොවැඩි විය යුතුයි.

(3) අපේක්ෂක අපේක්ෂිකාවන් වාර දෙකකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් අංකගණිතය ඇතුළු සම්මාන 4ක් සහිතව සමත් වී සිටිය යුතුයි.

(4) කාර්යාල ලිපිකටයුතු පුස්තකාල කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා සිටීමත් සිංහල සහ ඉංග්‍රීසි යතුරුලියනය ගැන සාමාන්‍ය හැකියාවක් තිබීමත් විශේෂ සුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

(5) අයදුම්කරුවන් තම අයදුම් පත් වලට පහත සඳහන් ලිපිවල පිටපත් අමුනා එවිය යුතුයි. මුල් පිටපත් නොවේ.

1. උප්පැන්න සහතිකය,
2. ලබා ඇති අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික,
3. චරිතය පිළිබඳ ලබාගත් සහතික පිටපත් තුනක්, මෙයින් එකක් ග්‍රාමසේවක සහතිකය විය යුතු අතර එම සහතිකය ප්‍රා. ආ. නි. තුමා විසින් අනු අත්සන් කළ යුතුයි.

6. **අයදුම්පත්.**—රජයේ ගැසට් පත්‍රයේ IV වන කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන තනතුරු වලට පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූලව සකස්කොට අයදුම්පත් 1973. 2. 28 වෙනි දිනට හෝ ඊට ප්‍රථම පාතදුම්බර උඩගම්පහ දකුණු ගම්සභාවේ සභාපතිතුමාට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ගම්සභා කාර්යාලය,
පිළවල,
ගුන්නැපාන.

වී. බී. සමරතුංග,
පා. දු. උ. ද. ගම්සභාවේ සභාපති තැන.

2–778—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන සේවය**

පළාත් පාලන විදුලිය අධිකාරීන්ගේ සේවයේ IV වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1973

පළාත් පාලන විදුලිය අධිකාරීන්ගේ සේවයේ IV වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගයක්, විභාග කොමසාරිස් විසින් 1973 අප්‍රේල් මස 7 වැනි දින කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වනු ලබන්නේ සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙනි.

2. **වැටුප් සහ සේවා කොන්දේසි :**

(අ) සමත්වන අයදුම්කරුවන් රු. 4,260ක වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩඉමක් සහිත රු. 3,540න් පටන්ගෙන, වර්ෂයකට රු. 90 බැගින් වැඩිවී, රු. 5,160 දක්වා නැගින වාර්ෂික වැටුපක් හිමි, පළාත් පාලන විදුලිය අධිකාරීන්ගේ සේවයේ IV වැනි ශ්‍රේණියේ තනතුරුවලට, පුරප්පාඩු ඇතිවන අන්දමට පත්කරනු ලැබේ. මීට අමතරව රජයේ ප්‍රමාණයන්ට හා නියමයන්ට අනුව විවාහක නිලධාරීන්ට විවාහක දීමනාවක් ද ගෙවනු ලැබේ. මෙම තනතුරු ස්ථිර වූත්, විශ්‍රාම වැටුප් රහිත වූත් ඒවා වෙති. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන නිලධාරීන් මෙම තනතුරු වලට පත්කිරීමේදී ඔවුන් නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම් තවදුරටත් භුක්ති විඳිනු ඇත. තවද, ඔවුන්ට පළාත් පාලන සේවා වැන්දඹු හා අනාථ දරු විශ්‍රාම වැටුප් අරමුදලට තවදුරටත් දායක මුදල් ගෙවිය හැක.

(ආ) සමත්වන අයදුම්කරුවන් පළාත් පාලන සේවා රෙගුලාසිවල අංක 22 (2) දරණ රෙගුලාසිය අනුව වැඩබැලීමේ පදනමක් මත පත්කරනු ලැබේ. ඔවුන් සිය තනතුරුවල ස්ථිර කිරීම වැඩ බැලීමේ කාලසීමාව අවසානයේදී සලකා බලනු ලැබේ. වැඩ බැලීමේ කාලසීමාව; ප්‍රථම අවස්ථාවේදී හය මසක කාලයකට සීමාවේ. තවද, ඔවුහු පළාත් පාලන සේවා ආඥාපනතට (264 පරිච්ඡේදය) හා එම ආඥාපනත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධනවලට හා එම ආඥාපනත යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලටද යටත් වෙති.

(ඇ) කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික පොරොන්දු පත්‍රයක් මගින් හෝ මුදල්වලින් හෝ තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින් ඇප තැබීමට අවශ්‍ය විය හැක.

(ඈ) තෝරා ගනු ලබන අයදුම්කරුවෝ, පත්වීම් ලබන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සීමාව තුළ පදිංචි විය යුතුය.

3. **සුදුසුකම්.**—පළාත් පාලන විදුලිය ෆෝර්මන්වරුන්ගේ සේවයේ පළමුවෙනි සහ දෙවැනි ශ්‍රේණිවල සේවයේ නියුක්ත, 1973 මාර්තු මස 15 වැනි දිනට හෝ ඊට පෙර පත්වීම් ස්ථිර කරනු ලැබූ අපේක්ෂකයින් මෙම විභාගයට ඉදිරිපත්වීමට සුදුස්සෝ වෙති. ඔවුහු, දැනට සේවයේ යෙදී සිටින ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මගින් සිය අයදුම් පත් ඉදිරිපත් කළ යුතුයි.

4. **අයදුම්පත්.**—

(අ) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙලකොට, "ලේකම්, පළාත් පාලනසේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530 කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

(ආ) අයදුම්පත්, 1973 මාර්තු මස 15 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ඇ) අයදුම්කරුවන් සිය අයදුම්පත්, තමා දැනට සේවයේ නියුක්ත ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මාර්ගයෙන් එවිය යුතුයි. මෙසේ කිරීමට යම් අපේක්ෂකයෙකු අපොහොසත්වුවහොත්, ඔහු නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

(ඈ) 1973 මාර්තු මස 15 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල් වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(ඉ) අයදුම්කරුවන් විසින් තම අයදුම්පතට රු. 20ක් වටිනා මුද්දර අලවා ඒ මත තම අත්සන තබා යථා පරිදි අවලංගු කළ යුතුය.

සැ. යු.—

(අ) නියමිත ආකෘති පත්‍රයේ නොලියන ලද අයදුම්පත්‍ර භාරගනු නොලැබේ.

(ආ) මෙම විභාගයේ නීති රීති වලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

5. විභාගයට ඇතුළත් කර ගැනීම.—

(අ) පිළිගනු ලැබූ අයදුම්පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශපත්‍ර විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයන් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

(ආ) අයදුම්කරුවන් තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමිත කොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ලැබේ.

(ඇ) ප්‍රවේශ පත්‍රයක් සමග කාල සටහනේ පිටපතක් ද අයදුම්කරුවන් වෙත එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයේදී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාරදිය යුතුයි.

(ඈ) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7කට වත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම—

"ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530, කොළඹ."

යන ලිපිනයට දැනුම්දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය :—

(i) විභාගයේ නම :————.

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(iii) සම්පූර්ණ ලිපිනය :————.

සැ. යු.—විභාගයට ඇතුළත් කරගැනීම, ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට සලකනු නොලැබේ.

6. මේ විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනීගියහොත්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක, ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරන්නට පිළිවන.

7. අපේක්ෂකයින් විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් ඔවුන් දනුවත්වම අසත්‍ය බව පෙනීගියහොත්, ඔවුන්ට පත්වීම් දෙනු ලැබුවත් සේවයෙන් පහ කරන්නට පිළිවන. සිතා මතා යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණොත්, ඒ සමානම දඬුවම් ලැබීමට පුළුවන.

**8. විභාගයට පෙනීසිටීම සඳහා නිවාඩු.**—ස්වකීය ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කරන පිළිගත්තා ලද අයදුම් පත්‍ර හිමි නිලධාරීන්ට විභාගයට පෙනීසිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**9. හඳුනාගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාගශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(අ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනාගැනීමේ පතක්,

(ආ) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළතදී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්,

(ඇ) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්,

(ඈ) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබාඇති අයෙකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායාරූපයක් :—

"පසුපිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති (අයදුම්කරුගේ නම) .......................................... යන අයගේ බව මම සහතික කරමි"

————,
අයදුම්කරුගේ අත්සන.

————,
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

නම හා තරාතිරම :————.

ලිපිනය :————.

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

**10. විභාග පරිපාටිය.**—විභාගය පවත්වනු ලබන්නේ කොටස් දෙකක් වශයෙනි. එනම්, 1 වැනි කොටස ලිඛිත විභාගය සහ 2 වැනි කොටස සම්මුඛ පරීක්ෂණය.

පහත සඳහන් වන්නේ විභාගය සඳහා ඇති විෂයයන් සහ එක් එක් විෂයයන් වෙනුවෙන් නියමිත ලකුණුත් ය. අශෝභන අත් අකුරු ගැන හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැන ද සියළුම ලිඛිත උත්තර පත්‍රවලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි ලෙස අකුරු ලියන ලද විභාග අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් වීමට ඉඩ තිබේ.

(අ) පළමුවන කොටස—ලිඛිත විභාගය :—

| විෂයයෝ | | ලකුණු |
|---|---|---|
| අවෂක්මතා (Low Tension) බෙදා හැරීමේ ක්‍රම ඉදිකිරීම සහ නඩත්තු කිරීම, ඩීසල් වලින් ක්‍රියා කරවන විදුලිබල මධ්‍යස්ථාන ක්‍රියාකිරීම හා නඩත්තුව, ගොඩනැගිලිවල විදුලිබල රෝපනය සහ පරීක්ෂා කිරීම, පොම්ප සවිකිරීම සහ ඒවා නඩත්තු කිරීම, විදුලිබලය සැපයීම සම්බන්ධ කිරීම පිණිස ඇස්තමේන්තු පිළියෙල කිරීම, 1950 අංක 19 දරණ විදුලිබල ආඥාපනතේ නීති සහ රෙගුලාසි පිළිබඳ මූලික සිද්ධාන්තික සහ ප්‍රායෝගික දැනුම විනිශ්චය කිරීම පිණිස පැය 3 ක ප්‍රශ්න පත්‍රයක් | ... | 100 |
| (ආ) දෙවැනි කොටස—සම්මුඛ පරීක්ෂණය | ... | 100 |

සැ. යු.—විභාගය පවත්වනු ලබන්නේ සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙනි.

11. පළමුකොට ලිඛිත විභාගය පවත්වනු ලැබේ. එහි ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්කරුවන් තෝරාගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයද පවත්වනු ලබන්නේ කොළඹදීය. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවිය යුතු අපේක්ෂකයින්ගේ සංඛ්‍යාව නිශ්චය කරනු ලබන්නේ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසිනි.

12. සමත්වන අයදුම්කරුවන්ගේ නම්, ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළකරනු ලැබේ. පුරප්පාඩු ඇතිවන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 පෙබරවාරි මස 08 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

විභාග අංකය :..............................
(කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි)

**ඉල්ලුම් පත්‍ර ආකෘති පත්‍රය**

පළාත් පාලන සේවය

**පළාත් පාලන විදුලිය අධිකාරීන්ගේ සේවයේ IV වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1973 අප්‍රේල් 7**

විභාගයට ඇතුළත්වීම සඳහා ඉල්ලුම් පත්‍රය

සැ. යු.—මෙම ආකෘති පත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදිවද, පැහැදිලිවද පුරවා, 1973 මාර්තු මස 15 වැනි දිනට හෝ ඊට පෙර හෝ "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ අපේක්ෂකයා දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

(1) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.

(2) අයදුම්කරු දැනට සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ නම :————.

(3) පළාත් පාලන විදුලිය ෆෝර්මන්වරුන්ගේ පළමුවැනි ශ්‍රේණියට පළමුවෙන්ම පත් කරනු ලැබූ දිනය :————.

(4) පළාත් පාලන විදුලිය ෆෝර්මන්වරුන්ගේ දෙවැනි ශ්‍රේණියට පළමුවෙන් පත්වීම ලද දිනය :————.

(5) දැනට උසුලන තනතුරේ ස්ථිර කරනු ලැබූ දිනය :————.

(6) පළාත් පාලන සේවයට පළමුවෙන්ම පත්වූ දින සිට උසුලන ලද පදවි නාමයන් :————.

(7) ඔබ විභාගයට පෙනී සිටීමට අදහස් කරන්නේ පහත සඳහන් කුමන මාධ්‍යයෙන්ද ?

(1) සිංහල :————.

(2) ඉංග්‍රීසි :————.

මෙහි ඉහත සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාස පරිදි සත්‍ය බව මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් සහතික කරමි. තවද, මම මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමට බැඳෙමි. එසේම මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කරන ලද සේ සැලකීමට ඉඩ ඇති බවද මැනවින් දනිමි.

| |
|---|
| අයදුම්කරු විසින් මෙහි රු. 20 ක මුද්දර අලවා ඒ මත තම අත්සන හා දිනයද යොදා යථා පරිදි අවලංගු කළ යුතුය. |

.......................................

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530,
කොළඹ.

මෙම ප්‍රාදේශිය බලමණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සේවයේ නියුක්ත ඉහත සඳහන් අයදුම්කරු.......................................... දින සිට පළාත් පාලන විදුලිය ෆෝර්මන්වරුන්ගේ සේවයේ පළමු වැනි/දෙවැනි ශ්‍රේණියට අයත් බවත්, ඔහුගේ සේවය සතුටුදායක බවත් සහතික කරමි. ඔහුගේ අයදුම්පතෙහි ඔහු විසින් ප්‍රකාශකොට ඇති විස්තර නිවැරදි බවත් සහතික කරමි.

.......................................

නාගරික කොමසාරිස්/සභාපති,
නා. ස./ප. ආ. ස./සු. න. ස./ග. ස.

දිනය :————.

2–752—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

එල්.ඩී.—බී. 28/71.

### ගම්සභා ආඥා පනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥා පනතේ 42 වැනි වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ ඇටැම්පිටිය ගම් ප්‍රදේශයෙහි ඇටැම්පිටිය ගම්සභාව විසින් සම්පාදිතව එකී වගන්තියෙන් තමා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
සවදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 2. 5 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි VII වන කොටසේ හෝ XII වන කොටසේ දැක්වෙන අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම, මේ අතුරු ව්‍යවස්ථා යටතේ කලින් අවලංගු කරන ලද්දේ නම් මිස, එකී බලපත්‍රය, නිකුත් කරනු ලබන්නේ යම් වර්ෂයක් සඳහා ද ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස් එක් වනදා අවසන් විය යුතුය.

2. සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි VII, X, XI, XII, XIII, XV, XVI, XVII, XVIII, XIX, XX, XXII, XXVI, හෝ XXVII කොටස්වල දැක්වෙන අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයක් සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම, සභාව විසින් ඒ සඳහා සපයා ඇති ආකෘති පත්‍රයෙහි පිටපත් දෙකකින් යුතුව—

(අ) ඒ ඉල්ලුම් පත්‍රය අළුත් බලපත්‍රයක් සඳහා නම්, එකී බලපත්‍රය අවශ්‍ය ව්‍යාපාරය ආරම්භ කිරීමට අදහස් කරන දිනට දවස් 30 (තිහකට) නොඅඩු කාලසීමාවකට කලින් ද,

(ආ) ඒ ඉල්ලුම් පත්‍රය තිබෙන බලපත්‍රයක් අළුත් කිරීම සඳහා නම්, එකී බලපත්‍රය අළුත් කිරීම අවශ්‍ය අවුරුද්දට කලින් අවුරුද්දේ සැප්තැම්බර් මස පළමුවන දින හෝ ඊට කලින්ද, සභාපති වෙත ලැබෙන සේ එවිය යුතුය.

3. මෙම අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් කෙරෙන අතර, "සභාව" යන්නෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ ඇටැම්පිටිය ගම්සභා ප්‍රදේශයේ ඇටැම්පිටිය ගම්සභාව අදහස් වේ.

2–728—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

# දේපල විකිණීම්

### අලව්ව සුළු නගර සභාව

### නිහ වරිපනම් ගාස්තු නොගෙවීම නිසා දේපල විකිණීමයි

1971 දෙසැම්බර් මස 31 වන දයින් අවසන් වන වර්ෂය වෙනුවෙන් මීට යාව ඇති උපලේඛණයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු නිහ වරිපනම් බදු අයකර ගැනීමට තහනම් කිරීම සඳහා වංචල දේපල නොමැතිවූ කල්හි, මහ නගර සභා ආඥාපණතේ (252 වන අධිකාරිය) 252 වැනි ජේදය ප්‍රකාර අලව්ව සුළු නගර සභාවේ ලේකම් වරයා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුලී සහ ලාභ, (2) දව සහ උපදින ද්‍රව්‍ය, (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලම ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම්බදු සහ වරෙන්තු ගාස්තු යථාකාලයේදී ගෙවනු නොලැබුවහොත්, එකී උපලේඛණයේ සඳහන් දිනයන්හි පෙරවරු 8 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

බී. ඒ. ධර්මසේන,
ලේකම්,
අලව්ව සුළු නගර සභාව.

1973 ජනවාරි මස 04 වන දින.
අලව්ව සුළු නගර සභා කාර්යාලයේදීය.

### උපලේඛනය

කොට්ඨාශ අංක 4—කඩ වීදිය

1973 පෙබරවාරි මස 20 වන දින පෙරවරු 8 සිට

දම්පැලැස්ස පාර : 145

ගිරිඋල්ල පාර : 167, 169, සහ 175

කොට්ඨාශ අංක 3—බරාදවත්ත

1973 පෙබරවාරි මස 21 වන දින පෙරවරු 8 සිට

දම්පැලැස්ස පාර : 223, 279/1, 309/10, 337, 359/4, 395, 433/1, 399, 433/3, 138, 142, 286, 334, 334/1, සහ 352

කොට්ඨාශ අංක 2—අලව්ව

1973 පෙබරවාරි මස 22 වන දින පෙරවරු 8 සිට

මැණික්වත්ත පාර (ජනරජ මාවත), 22/1, 22/2, 28

කුරුණෑගල පාර :

15, $15\frac{1}{1}$, $15\frac{1}{2}$, 17, $17\frac{1}{1}$, $17\frac{1}{2}$, 19, $19\frac{1}{1}$, $19\frac{1}{2}$, 21, $21\frac{1}{1}$, $21\frac{1}{2}$, 23, $23\frac{1}{1}$, $23\frac{1}{2}$, 25, $25\frac{1}{1}$, $25\frac{1}{2}$, 27, $27\frac{1}{1}$, $27\frac{1}{2}$, 29, $29\frac{1}{1}$, $29\frac{1}{2}$, 31, $31\frac{1}{1}$, $31\frac{1}{2}$, 33, 35, $35\frac{1}{1}$, $35\frac{1}{2}$, 35/1, 37, 41

කොට්ඨාශ අංක 1—මහඔය

1973 පෙබරවාරි මස 23 වන දින පෙරවරු 8 සිට

කුරුණෑගල පාර : 99/2, 99/3, 259, 267, 269, 118, 126, 128, 136, 144, 146, 148, 150, 172, 174, 180, 182, 390, 392, 394, 396, 398, 400, 402, 404, 410, 412, 414 සහ 420

කොට්ඨාශ අංක 5—පරමාඋල්ල

1973 පෙබරවාරි මස 26 වන දින පෙරවරු 8 ට

ගිරිඋල්ල පාර : 503, 595/4, 278/2 සහ 350

ගල්වාරම පාර : 8

2–710—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

**අම්බලන්ගොඩ විශේෂ කොමසාරිස් කාර්‍යාලය**

ප්‍රසිද්ධ වෙන්දේසියයි

හිඟ වරිපනම් බදු හා නාගරික නිවාස හිඟ බදු නොගෙවීම නිසා තහනමට ගන්නා ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 73.2.24 වැනි සෙන සුරාදා පෙ.ව. 9 ට මෙම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

ටීපෝ 1යි.

පොඩි කණ්නාඩි මේස 1යි.

දිග පුටු 1යි.

ඇඳි පුටු 2 යි.

පරණ කොස් අල්මාරි (වීදුරු නැත.) 1 යි.

ලොකු ස්ටූල් 2 යි.

පොඩි ස්ටූල් 2 යි.

ලොකු සැටි පුටු 1 යි.

පොඩි සැටි පුටු 4 යි.

කේ. වල්ගමගේ,
විශේෂ කොමසාරිස්—අම්බලන්ගොඩ නගරය.

2-535—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**දෙඩන්දූව සුළු නගර සභාව**

**දේපළ විකිණීම**

1973 ජනවාරි 05 වැනි දින අංක 41 දරණ රජයේ ගැසට් පත්‍රයේ හතර වැනි කොටසේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම, මුද්‍රණ දෝෂයක් නිසා අවලංගු කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එම දැන්වීමේ සඳහන් දේපල වෙන්දේසි කරන දිනයන් හා වේලාව යථා කාලයේදී ප්‍රසිද්ධ කරනු ඇත.

ඊ. ජී. ගුණවර්ධන,
ලේකම්,
දෙඩන්දූව සුළු නගර සභාව.

1973 ජනවාරි 31 වන දින,
දෙඩන්දූව සුළු නගර සභා කාර්යාලයේදීය.

2-400—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

**දෙඩන්දූව සුළු නගර සභාව**

හිඟ වරිපනම් බදු නොගෙවීම නිසා නිශ්චල දේපල විකිණීම

1954 වර්ෂයේ සිට 1971 වර්ෂය අවසානය දක්වා මෙහි පහත දක්වා ඇති උපලේඛණයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු හිඟ වරිපනම් අයකර ගැනීමට තහනම් කිරීම සඳහා චංචල දේපල නොමැති වූ කල්හි, 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥපනතේ 169(1) වගන්තිය සමග කියවෙන, 252 වන අධිකාරය වන මහ නගර සභා ආඥපනතේ 252 ඡේදයේ ප්‍රකාර මා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද (1) කුළී සහ ලාභ (2) දැව සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරන (4) පහත සඳහන් දේපලම, ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු හා වරෙන්තු ගාස්තු යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත් පහත උප ලේඛණයේ සඳහන් දිනයන්හි පෙරවරු 9 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබනබව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඊ. ජී. ගුනවර්ධන,
ලේකම්,
දෙඩන්දූව සුළු නගර සභාව.

1973 පෙබරවාරි මස 6 වන දින,
දෙඩන්දූව සුළු නගර සභා කාර්යාලයේදීය.

උපලේඛනය

කොට්ඨාශ අංක 2—මෝදර–පටුවත

**1973 මාර්තු 9 සිකුරාද**

යසෝදරා පාර :—වරිපනම් අංක : 23/4, 23/6ඒ, 23/9, 10/3, 18/2, 20.

සරණජෝති මාවත :—වරිපනම් අංක : 23/5, 79, 26/3, 30/9, 30/11, 44/2, 44/3.

**1973 මාර්තු 12 සඳුද**

යසෝදරා පාර :—වරිපනම් අංක : 22/1, 24බී, 28/2.

දෙඩන්දූගොඩ පාර :—වරිපනම් අංක : 21/2, 21/4, 16/1, 30/6.

දෙඩන්දූව පාර :—වරිපනම් අංක : 105/2, 105/3, 113, 6/4, 142/1.

කොට්ඨාශ අංක 3 මෝදර

**1973 මාර්තු 15 බ්‍රහස්පතින්ද**

රේගුව පාර :—වරිපනම් අංක : 15/4, 15/15, 15/16, 21/3, 25, 14, 18.

රේගුව හරස් පාර :—වරිපනම් අංක : 15/5, 21, 25/1, 14/1.

**1973 මාර්තු 19 සඳුද**

දෙඩන්දූව පාර :—වරිපනම් අංක : 193/17, 235, 235/1,251, 253/1, 293, 281/2, 299, 204/1, 242/2, 242/3, 242/4, 198/1.

**1973 මාර්තු 22 බ්‍රහස්පතින්ද**

ගොඩබැද්ද පාර :—වරිපනම් අංක : 3/1, 21.

සරණජෝති මාවත :—වරිපනම් අංක : 18/20.

දෙඩන්දූව පාර :—වරිපනම් අංක : 309/7, 309/9, 333, 242/5, 242/7, 242/9, 248/1.

කොට්ඨාශ අංක 4—දෙගල්ල

**1973 මාර්තු 26 සඳුද**

දෙගල්ල පාර :—වරිපනම් අංක : 9/2, 21/7, 27/10, 41/7, 41/11, 47, 12, 12/3, 44.

පන්සල පාර :—වරිපනම් අංක : 1/2, 22/3, 22/9, 24/1.

**1973 මාර්තු 29 බ්‍රහස්පතින්ද**

ගොඩබැද්ද පාර :—වරිපනම් අංක : 29, 43, 65/1, 65/17, 71, 79/1, 79/3, 79/4, 24, 60/1, 68/1, 68/4, 68/8, 68/9, 68/15.

2-702—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

**නිවාස හා නගර සංවර්ධන ආඥා පණත යටතේ දැන්වීමයි**

සිරිමාවෝ බණ්ඩාරනායක මාවතට (කලින් ඡේරාදෙනිය පාර) ඔබ්බෙහි පිහිටි සීබල් පෙදෙස යනුවෙන් හැඳින්වෙන වීථියේ අඩි 195 ක් දිග කොටසක් (මෙම කොටස, අවසරලත් මිනින්දෝරු හා මට්ටම්කරු, ජේ. යටවර විසින් පිළියෙල කරන ලද අංක 1327 හා 1971 මාර්තු මස 28 වැනි දින දරන සැලසුම්පතේ 'ඒ' සහ 'සී' යන අක්ෂරයන් අතර නිල් පැහැයෙන් දක්වා ඇත.) පොදු වීථියක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන බැව්, 268 වැනි අධිකාරය වන නිවාස හා නගර සංවර්ධන ආඥා පණතේ 26 (8) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ. ඉහත සඳහන් සැලසුම්පත නාගරික කාර්යාලයේදී පරීක්ෂාකර බැලිය හැක. යථෝක්ත වීථියේ එම කොටස පොදු වීථියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම ගැන, එකී කොටසට අභිමුඛව පිහිටි ස්ථානවල අයිතිකරුවන් විසින් එවනු ලබන ලිඛිත විරෝධතාවයන් 1973 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 12 දක්වා මවිසින් භාරගනු ලැබේ.

එච්. සී. බී. විජේසිංහ,
මහනුවර නාගරික කොමසාරිස්.

1973 ජනවාරි මස 30 වැනි දින,
මහනුවර මහ නගර සභා කාර්යාලයේදීය.

2-518—72.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## කුරුණෑගල මහ නගර සභාව

### ජල භීතිකා රෝගය

කුරුණෑගල නගරය තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගරය තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිලි ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසිම සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවලේම විනාශ කරනු ලබන බව (ලංකා ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය ගැසට් පත්‍රයේ පලවන දින සිට හය මාසයක කාලයක් බලපවත්වනවා ඇත.

නොයෙල් ඩී. සිල්වා සෙනෙවිරත්න,
නගරාධිපති, කුරුණෑගල.

මහ නගර සභා කාර්යාලය,
කුරුණෑගල, 1973 ජනවාරි මස 27 වෙනි දින.

2–746—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## බදුල්ල නාගරිකය

### ජල භීතිකා රෝගය

බදුල්ල නගරිකය තුළ ජල භීතිකා උවදුර පවතින බැවින් එම නාගරිකය තුළ පිහිටි, පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලේ හෝ ගෙවත්තක නොවන්නා වූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියෙකු) මවිසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව, (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1973 මාර්තු මස 1 වැනි දින සිට මාස 6 ක කාලයක් බලපවත්වනවා ඇත.

එච්. ඇම්. අබේපාල,
විශේෂ කොමසාරිස්,
බදුල්ල නාගරිකය.

1973 පෙබරවාරි මස 03 වැනි දින,
බදුල්ල නාගරිකයේ විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

2–705—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## හපුතලේ නගර සභාව

### ගෝඝාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

හපුතලේ නගර සභාවේ සභාපති, ඇස්. බී. විල්බට් සිල්වා වන මම, (272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥාපනතේ 17 (1) දරණ ඡේදයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 1973 වර්ෂයේ පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් දින වල, හපුතලේ නගර සභා සීමාව තුළ සත්ව ඝාතනය සහ මස් වෙළඳාම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

1. සියළුම පුර පසළොස්වක පෝය දිනයන්.
2. තයිපොන්ගල් දිනය.
3. මහ සිව රාත්‍රී දිනය.
4. වෙසක් දිනට පසු දිනය.
5. ජනරජ දිනය.
6. බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය.
7. දීපවාලී දිනය.
8. ලෝක සත්ව දිනය.

ඇස්. බී. විල්බට් සිල්වා,
සභාපති,
හපුතලේ නගර සභාව.

1973 ජනවාරි මස 23 වැනි දින,
නගර සභා කාර්යාලය,
හපුතලේ.

2–709—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## කළුතර දිස්ත්‍රික්කය—කළුතර නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපණතේ (272 අධිකාරය) 17(1) ඡේදයේ ප්‍රකාර නිසි බලධරයාවූ කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර නගර සභාවේ බලයලත් නිලධාරි වන ලියනගේ ජෝර්ජ් එඩ්වඩ් වික්‍රමසේකර වන මා වෙත පැවරී තිබෙන බලතල පරිදි, 1973 වර්ෂය තුළදී කළුතර නගර සභා සීමාව තුළ මෙහි පහත උප ලේඛණයේ සඳහන් දිනවලදී මස් පිණිස සතුන් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 1973 ජනවාරි 18 දා | — | පසළොස්වක් පෝය |
| 1973 පෙබරවාරි 16 දා | — | —එම— |
| 1973 මාර්තු 18 දා | — | —එම— |
| 1973 අප්‍රියෙල් 17 දා | — | —එම— |
| 1973 අප්‍රියෙල් 20 දා | — | මහ සිකුරාදා |
| 1973 මැයි 16 දා | — | වෙසක් පසළොස්වක් පෝය |
| 1973 මැයි 17 දා | — | වෙසක් පසළොස්වක් පෝයට පසු දින |
| 1973 ජූනි 15 දා | — | පොසොන් පසළොස්වක් පෝය |
| 1973 ජූලි 14 දා | — | පසළොස්වක් පෝය |
| 1793 අගෝස්තු 13 දා | — | —එම— |
| 1973 සැප්තැම්බර් 12 දා | — | —එම— |
| 1973 සැප්තැම්බර් 26 දා | — | බණ්ඩාරනායක ගුණානුස්මරණ දිනය |
| 1973 ඔක්තෝබර් 4 දා | — | ලෝක සත්ව දිනය |
| 1973 ඔක්තෝබර් 11 දා | — | පසළොස්වක් පෝය |
| 1973 නොවැම්බර් 10 දා | — | —එම— |
| 1973 දෙසැම්බර් 9 දා | — | —එම— |

එල්. ජී. ඊ. වික්‍රමසේකර.
බලයලත් නිලධාරී,
කළුතර නගර සභාව

1973. 1. 31 දින,
කළුතර, නගර සභා කාර්යාලයේ දීය.

2–437—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

### බලන්ගොඩ නගරය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර, නියමිත අධිකාරී තැන වූද, බලන්ගොඩ නගරයේ විශේෂ කොමසාරිස් තැන වූ ද, ජී. ඩී. ද සිල්වා වන මම, 1973 වර්ෂයේ දී පහත දැක්වෙන උප ලේඛනයෙහි සඳහන් දිනවලදී බලන්ගොඩ නගර සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

උපලේඛනය

ජනවාරි 4, 12, 18, 26
පෙබරවාරි 3, 10, 16, 25
මාර්තු 3, 5, 12, 18, 27
අප්‍රේල් 3, 10, 17, 20, 25
මැයි 3, 9, 16, 17, 22, 25
ජූනි 1, 9, 15, 24, 30
ජූලි 7, 14, 23, 30
අගෝස්තු 6, 13, 21, 28
සැප්තැම්බර් 4, 12, 19, 26
ඔක්තෝබර් 4, 11, 19, 26
නොවැම්බර් 3, 10, 17, 25
දෙසැම්බර් 3, 9, 16, 24

ජී. ඩී. ද සිල්වා,
විශේෂ කොමසාරිස්,
බලන්ගොඩ නගරය.

1973 පෙබරවාරි මස 02 වැනි දින,
බලන්ගොඩ නගරයේ,
විශේෂ කොමසාරිස් කායභාලයේ දීය.

2–521—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### කහවත්ත විශේෂ කොමසාරිස් කාර්යාලය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි, නිසි බලධාරියා වූද, කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස් තැන වූද, ජී. ඩී. ද සිල්වා වන මම, 1973 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛණයේ සඳහන් දින වලදී රත්නපුර දිස්ත්‍රික්කයේ කහවත්ත නගර ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම් කිරීම සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

1. 1973 ජනවාරි 18 වැනි දින — පසලොස්වක පෝය දිනය.
2. 1973 පෙබරවාරි 16 වැනි දින — පසලොස්වක පෝය දිනය.
3. 1973 මාර්තු 18 වැනි දින — පසලොස්වක පෝය දිනය.
4. 1973 අප්‍රේල් 17 වැනි දින — පසලොස්වක පෝය දිනය.
5. 1973 අප්‍රේල් 20 වැනි දින — මහ සිකුරාදා දිනය
6. 9173 මැයි 16 වැනි දින — වෙසක් පුර පසලොස්වක පෝය දිනය.
7. 1973 මැයි 17 වැනි දින — වෙසක් අතිරේක දිනය.
8. 1973 මැයි 22 වැනි දින — ජනරජ දිනය.
9. 1973 ජූලි 15 වැනි දින — පසලොස්වක පෝය දිනය.
10. 1973 ජූලි 14 වැනි දින — පසලොස්වක පෝය දිනය.
11. 1973 අගෝස්තු 13 වැනි දින — පසලොස්වක පෝය දිනය.
12. 1973 සැප්තැම්බර් 12 වැනි දින — පසලොස්වක පෝය දිනය.
13. 1973 ඔක්තෝබර් 4 වැනි දින — සමසත් ලෝක සත්ව දිනය.
14. 1973 ඔක්තෝබර් 11 වැනි දින — පසලොස්වක පෝය දිනය.
15. 1973 නොවැම්බර් 10 වැනි දින — පසලොස්වක පෝය දිනය.
16. 1973 දෙසැම්බර් 9 වැනි දින — පසලොස්වක පෝය දිනය.

ජී. ඩී. ද සිල්වා,
විශේෂ කොමසාරිස්—කහවත්ත නගරය.

1973. 2. 1 වැනි දින,
කහවත්ත විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

2 438—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### වලස්මුල්ල සුළු නගර සභාව

1973 වර්ෂයේ වරිපනම් ලේඛන

1973 වර්ෂය සඳහා මෙම සුළු නගර සභාවේ වරිපනම් ලේඛන දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කායභාල වේලාවන්හිදී මෙම කායභාලයේදී පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥා පනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරය වූ නාගරික සභා ආඥා පනතේ 235 (1) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එච්. ජේ. විජේසූරිය,
සභාපති,
වලස්මුල්ල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
වලස්මුල්ල,
1973 ජනවාරි 29 වැනිදා.

2–401—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### බෙන්තොට සුළු නගර සභාව

1973 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනතේ 256 වන අධිකාරියවන යටතේ 1972 වර්ෂයට බලපැවැත්වූ පහත සඳහන් දේපල බද්ද 1973 වර්ෂයටද, එලෙසම පැනවීමට බෙන්තොට සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

(256 වන අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපණතෙහි 159 වන වගන්තිය යටතේ මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටි සියළුම නිශ්චල දේපලවල (කුඹුරු හැර) වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) බැගින් වූ දේපල බදු, පිළිවෙලින් ජූනි 30 හා දෙසැම්බර් 31 දාගින් අවසන් වන අයුරු අර්ධ වාර්ෂිකව ගෙවිය හැකි වේ.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

1973 ජනවාරි 24 දින.
බෙන්තොට සුළු නගර සභා කාර්යාලයේ දීය,

2–363/1—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### බෙන්තොට සුළු නගර සභාව—1973 වරිපනම් ලේඛණ

1973 වර්ෂය වෙනුවෙන් පිළියෙල වී ඇති බෙන්තොට සුළු නගර සභාවේ වරිපනම් ලේඛණ රාජකාරී වේලාවන් තුළ මෙම කාර්යාලයේ දී පරීක්ෂා කිරීම පිණිස විවෘතව ඇති බව (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන (252 වැනි අධිකාරිය වන) නගර සභා ආඥා පණතේ 235(1) වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වමි.

චන්ද්‍රරත්න කොලොන්නෙ,
සභාපති,
බෙන්තොට සුළු නගර සභාව.

වර්ෂ 1973 ක්වූ ජනවාරි මස 26 වැනි දින,
බෙන්තොට සුළු නගර සභා කාර්යාලයේ දීය.

2–363/2—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## අගලවත්ත සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනතේ (256 වැනි අධිකාරය වන) 57 (3) වැනි වගන්තිය යටතේ, අගලවත්ත සුළු නගර සභාව වෙත පැවරී ඇති බලතල අනුව, පහත සඳහන් උපලේඛනය පරිදි අගලවත්ත නගරයේ මංමාවත් නම්කල බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

උපලේඛනය

අංක 1 කොට්ඨාශය

1. ශ්‍රී සෝමාලෝක මාවත
2. මල්වගුර මාවත
3. ශ්‍රී වර්ධනාරාම මාවත
4. මානානවත්ත පාර
5. කඳවුර පෙදෙස

අංක 2 කොට්ඨාශය

1. අරබ්බඩ මාවත
2. බේරගම මාවත
3. හැලඹ පාර
4. දත්වත්ත මාවත
5. පළමුවැනි පටුමග
6. දෙවැනි පටුමග

අංක 3 කොට්ඨාශය

1. දිගන්නගොඩ පාර
2. ප්‍රතිරාජ මාවත
3. කලවැල්ලාව පාර

අංක 4 කොට්ඨාශය

1. බදුරලිය පාර
2. ජී. බී. ඩේවිඩ් මාවත
3. ඉහලකන්ද පාර
4. තුන්වැනි පටුමග
5. පරණ පාර
6. හතරවැනි පටුමග

අංක 5 කොට්ඨාශය

1. කඹුරුගොඩ වත්ත පාර
2. දාපිලිගොඩ පාර
3. පස්වැනි පටුමග

ඒ. බී. මර්වින් සමරනායක,
සභාපති,
අගලවත්ත සුළු නගර සභාව.

1973. 1. 29 වැනි දින,
අගලවත්ත සුළු නගර සභා කාර්යාලයේ දීය.

2–461—1973.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## මොනරාගල විශේෂ කොමසාරිස් කාර්යාලය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වැනි අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල පරිදි නියමිත අධිකාරි තැනවූද, මොනරාගල නගරයේ විශේෂ කොමසාරිස්වූද, පීටර් මානෙල් ප්‍රේමතිලක වන මම, 1973 වර්ෂයේදී පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී, මොනරාගල දිස්ත්‍රික්කයේ, මොනරාගල සුළු නගර සභා ප්‍රදේශ සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම හෝ මස් ප්‍රදර්ශනය කිරීම මෙයින් සම්පූර්ණයෙන්ම තහනම් කරමි.

පීටර් මානෙල් ප්‍රේමතිලක,
විශේෂ කොමසාරිස්,
මොනරාගල නගරය.

1973 ජනවාරි මස 30 දින,
මොනරාගල විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

උපලේඛනය

| | | |
|---|---|---|
| පෙබරවාරි | 16 | පසළොස්වක පෝය දිනය |
| මාර්තු | 18 | එම |
| අප්‍රේල් | 17 | එම |
| මැයි | 16, 17 | වෙසක් පසළොස්වක දිනය හා පසු දිනය |
| ජූනි | 15 | පසළොස්වක පෝය දිනය |
| ජූලි | 14 | එම |
| අගෝස්තු | 13 | එම |
| සැප්තැම්බර් | 12, 26 | පසළොස්වක පෝය දින හා බණ්ඩාරනායක අනුස්මරණ දිනය |
| ඔක්තෝබර් | 4, 11 | ලෝක සත්ව දිනය හා පසළොස්වක දිනය |
| නොවැම්බර් | 10 | පසළොස්වක පෝය දිනය |
| දෙසැම්බර් | 9 | එම |

2–453—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## තිරගන් දහය නැගෙණහිර ගම්සභාව—කුරුණෑගල දිස්ත්‍රික්කය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර කරන උපලේඛනයේ සඳහන් අය විසින් එම උපලේඛනයේ දක්වෙන ස්ථානයේ 1973 වර්ෂයට එළහරක්මස් මස් විකිණීමට බල පත්‍රයක් ඉල්ලා අයදුම් පතක් මා වෙත එවා ඇති බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව කුරුණෑගල දිස්ත්‍රික්කයේ තිරගන් දහය නැගෙනහිර ගම්සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායැයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පනතේ 272 වෙනි පරිච්ඡේදයේ 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇම්. සුබයිර් මහතා, වත්තේගෙදර, කොහිලගෙදර ... | එළහරක් ... මස් | ඉහළ තලම්පිටියපළාතේ වත්තේගෙදර ගමේ තුත්තිරිපිටිය නමැති ඉඩමේ |

බී. ඩී. ඩිංගිරියා,
තිරගන් දහය නැගෙනහිර ගම්සභාවේ සභාපති.

1973.01.26 වෙනි දින,
වේරවැල්ල ගම්සභා කාර්යාලය,
ඉදුල්ගොඩකන්ද.

2–412—1973.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## හැටන්–දික්ඔය නගර සභාව

ගෝ ඝාතක ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අය විසින් එහි සඳහන් ස්ථානයන්හි 1973 වර්ෂයට ගෝ ඝාතක බල පත් ඉල්ලා මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝ ඝාතක ආඥා පනතේ (272 වැනි අධිකාරියේ) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

එම බල පත්‍රය නිකුත් කිරීම ගැන හැටන්–දික්ඔය නගර සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වනුයේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දනුම් දෙමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුවන්ගේ නම් | ස්ථානයේ නම |
|---|---|
| 1. එම්.එච්. එම්. මොහිදීන් | මස්කඩ අංක 23, ප්‍රසිද්ධවෙළඳපොල හැටන් |
| 2. එම්. හනිපා ආබිදීන් | ...මස්කඩ අංක 24 ප්‍රසිද්ධ වෙළඳපොල හැටන් |
| 3. එස්. එම්. ජොහාර් | ...මස්කඩ අංක 25, ප්‍රසිද්ධවෙළඳපොල, හැටන් |
| 4. එම්. එච්. එම්. යූසුප් | ...මස්කඩ අංක 26 ප්‍රසිද්ධවෙළඳ පොල, හැටන් |
| 5. ඒ. සී. එම්. පාරූක් | ...මස්කඩ අංක 27 ප්‍රසිද්ධවෙළඳපොල, හැටන් |
| 6. ටී. රෆීපායිදීන් | ...මස්කඩ අංක 390/බී, ප්‍රසිද්ධ වෙළඳපොල, දික්ඔය |
| 7. එම්. එච්. එම්. මොහිදීන් | එළුමස් කඩ අංක 390/1, ප්‍රසිද්ධ වෙළඳ වෙළඳ පොල, දික්ඔය |

ඕ. දෙන් විල්ප්‍රඩ්,
හැටන්–දික්ඔය නගර සභාවේ සභාපති.

1972.11.24 වැනි දින,
හැටන්-දික්ඔය,
නගර සභා කාර්යාලයේදී ය.

2–439—1973.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## වලස්මුල්ල සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (ලංකා නීති සංග්‍රහයේ 272 වන අධිකාරය) 17 වන වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධාරියා වූ වලස්මුල්ල සුළු නගර සභාවේ සභාපති, දුමින්ගු හේවාගේ ජිනදාස විජේසූරිය වන මම 1973 වර්ෂයේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී වලස්මුල්ල සුළු නගර සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළඳාම මෙයින් තහනම් කරමි.

#### උපලේඛනය

| | |
|---|---|
| 1973 ජනවාරි 18 | ... දුරුතු පුරපසළොස්වක පෝය දිනය |
| 1973 පෙබරවාරි 16 | ... නවම් පුරපසළොස්වක පෝය දිනය |
| 1973 මාර්තු 18 | ... මැදින් පුරපසළොස්වක පෝය දිනය |
| 1973 අප්‍රේල් 17 | ... බක් පුරපසළොස්වක පෝය දිනය |
| 1973 මැයි 14, 15 | ... වෙසක් පුරපසළොස්වක පෝය දිනට පෙර දෙදින |
| 1973 මැයි 16 | ... වෙසක් පුරපසළොස්වක පෝය දිනය |
| 1973 මැයි 17, 18, 19 | ... වෙසක් පුරපසළොස්වක පෝය දිනට පසු තෙදින |
| 1973 ජූනි 15 | ... පොසොන් පුරපසළොස්වක පෝය දිනය |
| 1973 ජූලි 14 | ... ඇසළ පුරපසළොස්වක පෝය දිනය |
| 1973 අගෝස්තු 13 | ... නිකිණි පුරපසළොස්වක පෝය දිනය |
| 1973 සැප්තැම්බර් 12 | ... බිනර පුරපසළොස්වක පෝය දිනය. |
| 1973 ඔක්තෝබර් 04 | ... සමස්ත ලෝක සත්ව දිනය |
| 1973 ඔක්තෝබර් 11 | ... වප් පුරපසළොස්වක පෝය දිනය |
| 1973 නොවැම්බර් 10 | ... ඉල් පුරපසළොස්වක පෝය දිනය |
| 1973 දෙසැම්බර් 09 | ... උඳුවප් පුරපසළොස්වක පෝය දිනය |

ඩී. එච්. ජේ. විජේසූරිය,
සභාපති,
වලස්මුල්ල සුළු නගර සභාව.

1973 ජනවාරි මස 31 වන දින,
වලස්මුල්ල සුළු නගර සභා කාර්යාලයේ දීය.

2-398—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## අලව්ව සුළු නගර සභාව

### 1973 වර්ෂයේ වරිපනම් ලේඛණ

1973 වර්ෂය සඳහා අලව්ව සුළු නගර සභාවේ වරිප්නම් ලේඛණ සූදානම් බවත්, කාර්යාල වේලාවන් හිදී ඒවා මෙම කාර්යාලයේ දී මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි බවත්, නගර සභා ආඥාපනතේ (252 වැනි අධිකාරය) 235 (1) කාණ්ඩය හා සම්බන්ධ වූ සුළු නගර සභා ආඥා පනතේ (256 වන අධිකාරයේ) 165 දරණ කාණ්ඩය යටතේ මෙයින් දන්වා සිටිමි.

එච්. ඇම්. කුමාරදාස,
සභාපති,
අලව්ව සුළු නගර සභාව.

1973 ක් වූ ජනවාරි මස 29 වැනි දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දීය.

2-449—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## යටියන්තොට නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලයය

### ගෝඝාතක ආඥා පනත (272 වන අධිකාරය)

ගෝඝාතක ආඥා පනතේ (272 වන අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර, නිසි බලධරයාවූද, යටියන්තොට නගරයේ විශේෂ කොමසාරිස් තැනවූද, නීල් ඩයස් වන මම, 1973 වර්ෂයේදී පහත දැක්වෙන උපලේඛනයේ දිනවලදී කෑගල්ල දිස්ත්‍රික්කයේ, යටියන්තොට නගර ප්‍රදේශ සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම හෝ මස් විකිණීම පිණිස ප්‍රදර්ශණය කිරීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

නීල් ඩයස්,
(නිසි බලධරයා).
විශේෂ කොමසාරිස්—යටියන්තොට නගරය.

1973 පෙබරවාරි මස 6 දින,
යටියන්තොට නගරයේ,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී.

#### උපලේඛනය

| | | | |
|---|---|---|---|
| 1. | 1973 ජනවාරි 18 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 2. | 1973 පෙබරවාරි 16 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 3. | 1973 මාර්තු 3 දින | — | මහ සිකුරාදා දිනය. |
| 4. | 1973 මාර්තු 18 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 5. | 1973 අප්‍රේල් 17 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 6. | 1973 මැයි 16 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 7. | 1973 මැයි 17 දින | — | වෙසක් අතිරේක දිනය |
| 8. | 1973 මැයි 22 දින | — | ජනරජ දිය. |
| 9. | 1973 ජූනි 15 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 10. | 1973 ජූලි 14 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 11. | 1793 අගෝස්තු 13 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 12. | 1973 සැප්තැම්බර් 12 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 13. | 1973 ඔක්තෝබර් 4 දින | — | ලෝක සත්ව දිනය. |
| 14. | 1973 ඔක්තෝබර් 11 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 15. | 1973 නොවැම්බර් 10 දින | — | පසළොස්වක පෝය දිනය. |
| 16. | 1973 දෙසැම්බර් 9 දින | — | පසළොස්වක පෝය දිනය. |

2-731—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් (සෝගාතක) පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් (ගෝඝාතක) පිළිබඳ ආඥාපණතේ (272 වැනි අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය ප්‍රකාර නිසි බලධරයාවූද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ගම්සභාවේ පාලන නිලධාරීවූද, කපුගමගේ ආරියසේන කරුණාරත්න වන මම 1973 වර්ෂය තුලදී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දිනවල මහව ගම්සභා සීමාව ඇතුළත මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීම හෝ විකිණීම ප්‍රදර්ශණය කිරීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

#### උපලේඛනය

1973 පෙබරවාරි 3, 10, 16, 25.
1973 මාර්තු 5, 12, 18, 27.
1973 අප්‍රේල් 3, 10, 17, 25.
1973 මැයි 3, 9, 16, 17, 22, 25.
1973 ජූනි 1, 8, 15, 24, 30.
1973 ජූලි 7, 14, 23, 30.
1973 අගෝස්තු 6, 13, 21, 28.
1973 සැප්තැම්බර් 4, 12, 19, 26.
1073 ඔක්තෝබර් 4, 11, 19, 26.
1973 නොවැම්බර් 3, 10, 17, 25.
1973 දෙසැම්බර් 3, 9, 16, 24.

කේ. ඒ. කරුණාරත්න,
පාලන නිලධාරී—මහව ගම්සභාව හා
පළාත් පාලන සහකාර කොමසාරිස්, කුරුණෑගල.

1973 ජනවාරි 30 වැනි දින,
මහව ගම්සභා කාර්යාලයේ දී.

2-459—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

### පාදුක්ක-වග ගම් ප්‍රදේශයේ පාලන නිලධාරි කාර්යාලය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 වන අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරය) 17(1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලය පරිදි නිසි බලධරයා වූද පාදුක්ක-වග ගම්ප්‍රදේශයේ, පාලන නිලධාරි වූද, අයි. ඇන්. පී. සූරියප්පෙරුම වන මම, 1973 වර්ෂය තුළ මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී, කොළඹ දිස්ත්‍රික්කයේ පාදුක්ක-වග ගම් ප්‍රදේශය තුළ මස් පිණිස සතුන් මැරීම සහ මස් වෙළඳාම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

| | | |
|---|---|---|
| 1973 ජනවාරි 18 | — | පසළොස්වක පොහෝ දිනය |
| 1973 පෙබරවාරි 16 | — | පසළොස්වක පොහෝ දිනය. |
| 1973 මාර්තු 18 | — | පසළොස්වක පොහෝ දිනය. |
| 1973 අප්‍රියෙල් 17 | — | පසළොස්වක පොහෝ දිනය. |
| 1973 මැයි 16 | — | වෙසක් පොහෝ දිනය. |
| 1973 මැයි 17 | — | වෙසක් පෝයට පසු දිනය. |
| 1973 ජූනි 15 | — | පොසොන් පෝය දිනය. |
| 1973 ජූනි 16 | — | පොසොන් පෝයට පසු දිනය. |
| 1973 ජූලි 14 | — | පසළොස්වක පොහෝ දිනය. |
| 1973 අගෝස්තු 13 | — | පසළොස්වක පොහෝ දිනය. |
| 1973 සැප්තැම්බර් 12 | — | පසළොස්වක පොහෝ දිනය |
| 1973 ඔක්තෝබර් 4 | — | ලෝක සත්ව දිනය. |
| 1973 ඔක්තෝබර් 11 | — | පසළොස්වක පොහෝ දිනය. |
| 1973 නොවැම්බර් 10 | — | පසළොස්වක පොහෝ දිනය |
| 1973 දෙසැම්බර් 9 | — | පසළොස්වක පොහෝ දිනය. |

අයි. එන්. පී. සූරියප්පෙරුම,
පාලන නිලධාරී,
පාදුක්ක-වග ගම් ප්‍රදේශය.

1973. 2. 1 දින,
පාදුක්ක-වග ගම් ප්‍රදේශයේ,
පාලන නිලධාරි කාර්යාලයේ දිය.

2–730—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### කෝට්ටේ නගරය

(272 වැනි අධිකාරය) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින්, මස් විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන, කෝට්ටේ නගර සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළතදී මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, (272 වැනි අධිකාරය) මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

උපලේඛනය

| | |
|---|---|
| 1. එස්. පී. එන්. ඒ. කරීම් මහතා, අංක 93, විවේකානන්ද හිල්, කොළඹ 13. | අංක 1, 2 සහ 3 හරක් සහ එළුමස් වෙළඳ සැල්, ප්‍රසිද්ධ වෙළඳ සැල—නුගේගොඩ. |
| | පිට කෝට්ටේ අංක 4, හරක් මස් වෙළඳ සැල ප්‍රසිද්ධ වෙළඳ සැල—පිට කෝට්ටේ. |
| | හරක් මස් වෙළඳ සැල, ප්‍රසිද්ධ වෙළඳ සැල—වැලිකඩ. |
| | නුගේගොඩ ජම්බුගස්මුල්ල පටුමගෙහි සහ රාජගිරිය මංසන්ධියේ පිහිටි හරක් මස් වෙළඳ සැල්. |

ඔලිවර් ගුරුසිංහ,
විශේෂ කොමසාරිස්,
කෝට්ටේ නගරය.

1972.12.18 දින,
කෝට්ටේ නගරයේ විශේෂ කොමසාරිස් කාර්යාලය,

2–240—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ දිස්ත්‍රික්කයේ එගොඩපොත ගම්සභාව

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 අධිකාරය)

17 වැනි ඡේදය යටතේ නියෝගය

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (ලංකා නීති ප්‍රඥප්ති සංග්‍රහයේ 272 අධිකාරය) 17 (1) ඡේදය ප්‍රකාර නිසි බලධරයාවූ එගොඩපොත ගම්සභාවේ සභාපති තැන්පත්, ඒ. යූ. විලියම් සිංඤෝ වන මම යථෝක්ත ආඥාපනතේ මා වෙත පැවරී තිබෙන බලයේ පරිදි 1973 වර්ෂය තුළදී එගොඩපොත ගම්සභා ප්‍රදේශය තුළ පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවලදී මස්පිණිස සතුන් මැරීම හා මස් විකිණීම මෙයින් තහනම් කරමි.

උපලේඛනය

| | | |
|---|---|---|
| 1973 ජනවාරි 18 | ... | දුරුතු පුර පසළොස්වක දින |
| 1973 පෙබරවාරි 16 | ... | නවම් පුර පසළොස්වක දින |
| 1973 මාර්තු 18 | ... | මැදින් මස පුර පසළොස්වක දින |
| 1975 අප්‍රේල් 17 | ... | බක් මස පුර පසළොස්වක දින |
| 1973 මැයි 16 | ... | වෙසක් මස පුර පසළොස්වක දින |
| 1973 මැයි 17 | ... | වෙසක් දිනට පසු දින |
| 1973 මැයි 22 | ... | ජනරජ දින |
| 1973 ජූනි 15 | ... | පොසොන් මස පුර පසළොස්වක දින |
| 1973 ජූලි 14 | ... | ඇසළ මස පුරපසළොස්වක දින |
| 1973 අගෝස්තු | ... | නිකිනි මස පුර පසළොස්වක දින |
| 1973 සැප්තැම්බර් 12 | ... | බිනර මස පුර පසළොස්වක දින |
| 1973 සැප්තැම්බර් 26 | ... | බණ්ඩාරනායක සමරු දින |
| 1973 ඔක්තෝබර් 4 | ... | ලෝක සත්ව දින |
| 1973 ඔක්තෝබර් 11 | ... | වප් මස පුර පසළොස්වක දින |
| 1973 නොවැම්බර් 10 | ... | ඉල් මස පුර පසළොස්වක දින |
| 1973 දෙසැම්බර් 9 | ... | උඳුවප් මස පුර පසළොස්වක දින |

ඒ. යූ. විලියම් සිංඤෝ,
එගොඩපොත ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
නිට්ටඹුව, 1973.01.17.

2–369—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### පලාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පලාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පලාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද සංශෝධිතයට දක්වන XVIII වැනි කාණ්ඩය පිළිගැනීමටත්, එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලවන දින සිට ලග්ගල පල්ලේසිය පත්තුව ගම් ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, 1972. 12. 30 වෙනි දින රැස්වීමේදී සම්මත වූ අංක 3 දරණ යෝජනාවෙන් තීරණය කළ බැව් ප්‍රකාශ කරමි.

පී. ජී. මුතුබණ්ඩා,
සභාපති,
ලග්ගල පල්ලේසිය පත්තුව ගම්සභාව.

1973. 01. 29.
ලග්ගල-පල්ලේගම, ගුරුවෙල,
ලග්ගල පල්ලේසිය පත්තුව ගම්සභා කාර්යාලයේ දිය.

අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ.", තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :

උපලේඛනය

1 වැනි කොටස - අන්තරාදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැණීම,
කබුක් බොරළු හෝ කළුගල් ගබඩා කිරීම,
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රෝස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩාකර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යාන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ෂණය.
ගැලුම් 50 වැඩි ප්‍රමාණයක පොල්තෙල් ගබඩා කර තබා ගැනීම.
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩා කර තබා ගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු පුළුන් ගබඩා කර තබා ගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
ගඩොල් හෝ උළුගබඩා කර තබා ගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පිදුරු ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩා කර තබා ගැනීම .
කුලියට දීම සඳහා ලාම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මහ භෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
අතින් ලී ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
දව ගබඩාවක් පවත්වාගෙන යෑම.
දර ගබඩාවක් පවත්වාගෙන යෑම.
ගිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරන පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.
තොග වශයෙන් විකිණීම සඳහා, පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩා කර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යෑම.
අලුත් හෝ පැච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල් කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන් දගම් හෝ ගෙන් දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පාවිච්චි කරණ ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩා කර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම(ස්ප්‍රේ පෙන්ටිං) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වියීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
සිල්ක් සහ කෘතිම රෙදි වියීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

2 වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කර තබාගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
හම් ගබඩා කර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩා කර තබා ගැනීම.
කුකුළන් 100 කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.
රබර් නිෂ්පාදය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
පශු වෛද්‍ය ශිලන් හලක් පවත්වාගෙන යාම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළුකෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
කරවල, ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම, හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාගාර ගබඩාවක් පවත්වාගෙන යෑම.
පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාගාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංසාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මැග්නෝක්කා කැට (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ට්‍රන්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.
ඉලාගමය සුන් බුන් ද්‍රව්‍ය ගබඩා කර තබා ගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩාකර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩා කර තබා ගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල් ලෙලි හෝ දුව පල්කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
විනාකිරි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
හුණු ගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම.
පැනි නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩා කර තබා ගැනීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
සෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩා කර තබා ගැනීම.
සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම.
පළතුරු, මාලු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මහභෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය මහභෝග කෙටීම.
බේකින් පවුඩර් නිපදවීම.
මාජරින් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොහොට් නිපදවීම.
ඉටි පන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ පුයර නිපදවීම.
පාසල් රටහුණු නිපදවීම.
ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වා ගෙන යෑම.

සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.

ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසල් ගල්ලෑලි නිපදවීම.

සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.

ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.

මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම.

සීත කළ මස් හෝ මාළු ගබඩා කර තැබීම.

කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.

මැණික් ගල් කැපීම හා ඔප දැමීම.

දිය හුණු, සුදු (වයිට්ං) හුණු හෝ හිරියල් නිපදවීම.

එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

3 වැනි කොටස—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිනිරන් සුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, (කරදමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලිනික් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිනි කෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝරවරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩා කර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යෑම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම,

වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජතෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.

පැට්‍රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කොයිල් (කොයිල්ස්) නිපදවීම.

ලී දඹු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල්තාර හෝ වෙනත් බිටුමත්මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැඩපත් නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇන නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අලුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනින් හෝ ක්ලච් ලයිනින් නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුනු කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

රන් කම් සූත්‍ර බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ශනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩපලක් හෝ ගුවන්විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් පවත්වාගෙන යෑම.

2 686—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## පැල්මඩුල්ල සුළු නගර සභාව

### සුළු නගර සභාව මගින් පාලනය වන මංමාවත්

1969.8.15 වැනි දින අංක 14,867 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළවූ ඉහත සඳහන් මංමාවත් ලැයිස්තුවට පහතින් සඳහන් කොට ඇති මංමාවත් 2 ඇතුළත් කරන්නට යෙදුන බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මංමාවත් පිළිබඳ යම්කිසි විරුද්ධතාවයක් හෝ අයිතිවාසිකමක් කිසියම් පුද්ගලයෙකුට දන්වා සිටීමට ඇත්නම්, ඒ බව මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත ලියවිල්ලක් මගින් මාවෙත දන්වා සිටිය හැක.

මෙහි සඳහන් මංමාවත් පිළිබඳ වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළදී කාර්යාලයෙන් අසා දැනගත හැක.

එච්. ඇල්. මරික්කාර්,
පැල්මඩුල්ල සුළු නගර සභාවේ සභාපති.

සුළු නගර සභා කාර්යාලය,
පැල්මඩුල්ල, 73.1.27.

| කොට්ඨාශ අංකය | පාරේ නම | දිග | පළල | තාර දැමූ කොටස | බොරලු සහිත වාහන යාහැකි පාර | අඩි පාර |
|---|---|---|---|---|---|---|
| | | සැ.දැ.අඩි | අඩි | දැ. | දැ. අඩි | දැ.අඩි |
| 1 ... | කොඩිකාරගේ වත්තේ සිට හැන්තැල්ල ගෙදර වත්ත හරහා නාන තොටුපල දක්වා යන පාර ... ... ... ... | – 7 – | ... 8 ... | — ... | — ... | 7 – |
| 2 ... | පහල දෙලිස්සිගෙදර වත්ත සිට ඉහළ දෙලිස්සිගෙදර වත්ත දක්වා යන පාර ... | – 5 – | ... 8 ... | — ... | — ... | 5 – |

3-402—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

## මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම පස්බාගේ කෝරලේ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උප ලේඛණයේ දක්වෙන අය ඔහුගේ නමට ඉදිරියෙන් ඇති ස්ථානයේ මස් පිණිස සතුන් මරා, මස් විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, එසේ බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පස්බාගේ කෝරළේ ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කරමින් පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දන්වීම් ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරයේ) අංක 7 (2) ඡේදය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම් කරන්නාගේ නම | ගවයින් මරණ ස්ථානය | ගව මස් විකුණන ස්ථානය | වෙළඳාමේ ස්වභාවය |
|---|---|---|---|
| ඒ. ඒ. අෂිස්, අංක 27, ජයසුන්දර මාවත, නාවලපිටිය | අංක 5 දරණ කොට්ඨාශයේ ජයසුන්දර මාවතේ කොඩිගහ වෙල්ල නැමති ඉඩමේ | අංක 5 දරණ කොට්ඨාශයේ ජයසුන්දර පටු මාවතේ අංක 27 දරණ ස්ථානය | හරක් මස් |

ඇස්. මාරසිංහ,
සභාපති, පස්බාගේ කෝරළේ ගම්සභාව.

1973 ජනවාරි මස 23 වැනි දින,
ගම්සභා කායර්‍යාලය,
රඹුක්පිටිය.

2–269—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ කොටදෙනියාවේ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 272 අධිකාරයේ 7 (2) (ඒ) යටතේ දක්වන අතර, උපලේඛනයේ සඳහන් අයවලුන් විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලා මා වෙත අයදුම් පත් ඉදිරිපත් කර ඇති බව, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන විරුද්ධ වන කොටදෙනියාව ගම්සභා ප්‍රදේශ සීමාව තුළ පදිංචි යම් කෙනෙක් වේ නම් තමා එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවී දින 14 ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරයේ) 7 (2) (බී) වන වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය,

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය | බලපත්‍රයේ ස්වභාවය |
|---|---|---|
| 1. අයි. ජෝකිනු ප්‍රනාන්දු ... ... ... ... | කොටදෙනියාව .... | ඌරුමස් වෙළඳාම |
| 2. කේ. ඇම්. ඒ. කරීම් ... ... ... ... | කොටදෙනියාව ... | එළුහරක් මස් සහ එලුමස් වෙළඳාම |

ඩබ්ලිව්. එච්. ජයකොඩි,
කොටදෙනියාව ගම්සභාවේ සභාපති.

1973 ජනවාරි මස 16 වැනි දින,
කොටදෙනියාව ගම්සභාව,
කලුඅග්ගල, බාදුරාගොඩ.

2–242—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩපළාත ගම් සභාව

### ගෝඝාතක ආඥාපනත—272 වැනි අධිකාරය

මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වෙන අය විසින් මස් විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන් බවත්, එම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධව උඩපලාත ගම්සභා ප්‍රදේශය තුල පදිංචි ඕනෑම කෙනෙකුට, තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව, මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දිනය සිට දින 14ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳව ආඥාපනතේ 272 වන අධිකාරයේ අංක 7 දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දනුම දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ඇම්. ඒ. අබුසාලි මහතා, රාගල, හල්ග්‍රන්ඔය ... ... | හරක් මස් ... | නො. 16, රාගල කඩවීදිය, හල්ග්‍රන්ඔය |
| ඇම්. ඒ. අබුසාලි මහතා, රාගල, හල්ග්‍රන්ඔය ... ... | එලු මස් ... | ස්ටැපර්ඩ් පාර, රාගල, හල්ග්‍රන්ඔය |
| කේ. බාවා මහතා, රාගල, හල්ග්‍රන්ඔය ... ... ... | හරක් මස් ... | රාගල කඩවීදිය, හල්ග්‍රන්ඔය |
| ජේ. ඩී. අබ්දුල් වහාබ්, සෙල්වකන්ද, උඩුපුස්සැල්ලාව ... ... | හරක් මස් ... | සෙල්වකන්ද කඩවීදිය, උඩපුස්සැල්ලාව |

සුනිල් කුමාරදස,
සභාපති, උඩපලාත ගම්සභාව.

1973 ජනවාරි මස 26 වැනි දින,
ගම්සභා කායර්‍යාලය,
රාගල, හල්ග්‍රන්ඔය.

2–748—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

### කඩුවෙල ගම්සභාව

සෝගාතක ආඥා පනත

මෙහි පහත උපලේඛනයේ දක්වෙන අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බැවින් ඒ අනුව මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කඩුවෙල ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම ගැසට් දැන්වීම පත්‍රයේ පලවූ දින සිට දින දහහතරක් ඇතුලත මා වෙත එවීමට බලය තිබෙන බවත්, සෝගාතක ආඥා පනතේ (272 අධිකාරි) 7 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| 1. ඇම්. ඇස්. දවුඩ්, 3/162, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ ... | කඩුවෙල පොදු වෙළෙඳපොලේ මස් කඩය ... | හරක් මස් |
| 2. ඇම්. ඇස්. දවුඩ්, 3/162, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ ... | හරක්මස් කඩය, කඩේවත්ත, වැලිවිට ... ... | හරක්මස් |

අයි. ජෝතිපාල,
වැඩ බලන සභාපති, කඩුවෙල ගම්සභාව.

ගම්සභා කායයීාලය, කඩුවෙල,
73.2.7 වැනි දින

2–717—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### ගොඩපිටිය ගම්සභාව

ගෝ ඝාතක ආඥා පණත

මෙහි පහත උප ලේඛණයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් වන ස්ථානයේ 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා බලපත්‍රයක් ඉල්ලා මා වෙත අයැදුම් පතක් ඉදිරිපත් කැර ඇති බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥා පණතේ 272 වන පරිච්ඡෙදයේ අංක 7 දරණ වගන්තියේ 2 දරණ උප වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙමි. තවද, මෙම අයට මෙකී කරුණ සඳහා බලපත්‍රයක් නිකුත් කිරීමට ගොඩපිටිය ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙකු විරුද්ධ වන්නේ නම්, ඒ සඳහා තමන් විරුද්ධ වන්නේ අසුවල්, අසුවල් කරුණු නිසාය යන්න සනාථ කිරීමට අවශ්‍ය කරුණු ගොනු කැරුණු ලියැවිල්ලක් පිටපත් දෙකෙකින් යුතුව ලියා අත්සන් කොට මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවීමට බලය ඇති බව, ඉහත සඳහන් ආඥා පණතේ 272 වන පරිච්ඡෙදයේ අංක 7 දරණ වගන්තියේ 2 (ඒ) හා (බී) දරණ උප වගන්තිය ප්‍රකාර මෙයින් දන්වමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරු ගේ නම හා ලිපිනය | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. එම්. ජේ. එම්. නූර්දීන්, වෙනගොඩ ඕවිට, ගොඩපිටිය, අකුරැස්ස ... | හරක් මස් ... | මූණමල්ගහඕවිට, ගොඩපිටිය |

ඩී. ජේ. ඇම්. ගුණවර්ධන,
ගොඩපිටිය ගම්සභාවේ සභාපති තැන.

1973 පෙබරවාරි මස 7 වන දින,
අකුරැස්සේ–විල්පිට ගොඩපිටිය ගම්සභා කාර්යාලයයේ දීය.

2–758—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

### උඩපළාත ගහපහළ ගම්සභාව, ගල්ගෙඩියාව, ගම්පොල

1973 අය වැය ලේඛණය

උඩපළාත ගහපහළ ගම්සභාවේ 1973 වර්ෂයේ අයවැය ලේඛණයට අදළ වන මෙහි පහත උප ලේඛණයේ සඳහන් බදු හා බලපත්‍ර ගාස්තු 1973 ජනවාරි මස 1 වැනි දින සිට පනවා අයකිරීමට අදහස් කරණ යෝජනාව 1972.9.29 දින පස්වරු 2,30ට පැවැත්වූ රැස්වීමේදී සභා සම්මත කරගත් බව ගම්සභා නියෝගවල 4 වැනි කාන්ඩයේ 8 '1' දරණ නියෝගය ප්‍රකාර මහජනයා වෙත මෙයින් දනුම්දෙමි.

#### උපලේඛනය

1. **අක්කර බද්ද :**—අක්කර බද්දට යටත්වන සෑම ඉඩමකින්ම වර්ෂයකට අක්කරයකට රුපියල් දෙක බැගින්

2. **වරිපනම් බද්ද :**—ගොඩනැගිලි සෑදූ ගම්මැන්ඩි වශයෙන් ප්‍රකාශයට පත්කරණ ලද සෑම ප්‍රදේශයකම ඉඩම් හා ගොඩනැගිලි වල වාර්ෂික වටිනාකමින් සියයට 5 යි (පහයි)

| | රු. | ශ. |
|---|---|---|
| 3. **රථවාහන හා සත්ත්ව බද්ද :** | | |
| කරත්තයක්, තිරික්කලයක් හෝ ජින් රික්ෂෝ කරත්තයක් හැර වෙන ඕනෑම අත්දමක සෑම වාහනයකට ... | 5 | 0 |
| ඕනෑම අත්දමක සෑම /ගොන්දෙන්නා බඳින බර කරත්තයකට හෝ තිරික්කලයකට ... ... | 4 | 0 |
| සෑම තනිගොනා බඳින බරබාග කරත්තයකට හෝ තිරික් කලය කට හෝ අත් කරත්තයකට ... ... | 2 | 50 |
| සෑම ජින් රික්ෂෝ කරත්තයකට ... ... | 2 | 50 |
| සෑම බයිසිකලයකට ... ... ... | 1 | 0 |
| සෑම ඇතෙකුට හෝ අලියෙකුට ... ... | 10 | 0 |
| සෑම අශ්වයෙකුට ... ... ... | 5 | 0 |
| සෑම අශ්ව තරයෙකුට ... ... | 2 | 50 |
| සෑම බූරුවෙකුට ... ... ... | 2 | 50 |

| | රු. | ශ. |
|---|---|---|
| 4. **වෙළඳ බලපත්‍ර ගාස්තු :** | | |
| බේකරියක් පවත්වාගෙන යාම සඳහා වූ බලපත්‍රය | | |
| (අ) බිම්ප්‍රමාණය වර්ග අඩි 100ට වැඩි නොවන විට ... | 25 | 0 |
| (ආ) බිම්ප්‍රමාණය වර්ග අඩි 100ට වැඩිවන විට ... | 35 | 0 |
| තේ හෝ කෝපිකඩයක් පවත්වාගෙන යාම සඳහා වූ බලපත්‍රය— | | |
| (අ) ගොඩනගනලද ප්‍රදේශයක් වශයෙන් ගම්සභාව විසින් යථාපරිදි ප්‍රකාශිත ප්‍රදේශයක— | | |
| (1) බිම් ප්‍රමාණය වර්ග අඩි 200ට වැඩි නොවන විට | 15 | 0 |
| (2) බිම් ප්‍රමාණය වර්ග අඩි 200ට වැඩිවන විට ... | 17 | 50 |
| (ආ) වෙනයම් ප්‍රදේශයක ... ... | 12 | 50 |
| කිරිපට්ටියක් පවත්වාගෙන යාම සඳහා වූ බලපත්‍රය— | | |
| එලදෙනුන් සංඛ්‍යාව 2ට වැඩි එහෙත් 5ට අඩුවන විට ... | 10 | 0 |
| එලදෙනුන් සංඛ්‍යාව 5ට වැඩි එහෙත් 10ට අඩුවන විට ... | 35 | 0 |
| එලදෙනුන් සංඛ්‍යාව 10ට වැඩි එහෙත් 25ට අඩුවන විට ... | 50 | 0 |
| එලදෙනුන් සංඛ්‍යාව 25ට වැඩි වූ විට ... ... | 100 | 0 |
| කුළුබඩු විකිණීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා වූ බලපත්‍රය— | | |
| (අ) ගොඩනගන ලද ප්‍රදේශයක් වශයෙන් ගම්සභාව විසින් යථා පරිදි ප්‍රකාශිත ප්‍රදේශයක ... ... | 15 | 0 |
| (ආ) වෙන යම් ප්‍රදේශයක ... ... | 15 | 0 |
| ශීත කරන ලද මස් විකිනීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යාමට බලපත්‍රය ... ... | 25 | 0 |
| පළතුරු විකිනීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යැමට බලපත්‍රය ... ... | 7 | 50 |
| එලවළු විකිනීම සඳහා සාප්පුවක් හෝ ස්ථානයක් පවත්වාගෙන යැමට බලපත්‍රය ... ... | 7 | 50 |
| රබර් දුම් ගැස්සීම හා නිපදවීම සඳහා බලපත්‍රය ... | 50 | 0 |
| රා එක්රැස් කරණ ස්ථානයක් තබා ගැනීම සඳහා බලපත්‍රය— | | |
| (අ) පොල්ගස් සංඛ්‍යාව 200ට වැඩි නොවන විට ... | 100 | 0 |
| (ආ) පොල්ගස් සංඛ්‍යාව 200ට වැඩි එහෙත් 400ට නොවැඩි ... | 200 | 0 |
| පොල්ගස් සංඛ්‍යාව 400ට වැඩි වන විට ... | 250 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| බිඩි නිපදවීම සඳහා බලපත්‍රය ... ... | 25 | 0 |
| ලී වෙළඳ සැලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ... | 75 | 0 |
| තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය | 250 | 0 |
| මිරිස්, කෝපි, පිටි, ධාන්‍ය, හෝ කුළු බඩු හෝ වෙනත් මෑ වර්ග ඇඹරීම සඳහා බලපත්‍රය ... ... | 50 | 0 |
| යන්ත්‍රානුසාරයෙන් ක්‍රියා කෙරෙන ලී මෝලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ... ... | 100 | 0 |
| මෝටර් ගරාජයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය— | | |
| බිම් ප්‍රමාණය වර්ග අඩි 500ට වැඩි නොවන විට ... | 35 | 0 |
| බිම් ප්‍රමාණය වර්ග අඩි 500ට වැඩි වන විට ... | 50 | 0 |
| ලි මෝලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ... | 75 | 0 |
| කොන්ඩා කැපීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ... ... | 15 | 0 |
| යන්ත්‍ර නොමතිව ගඩොල් හෝ උළු නිපදවීම සඳහා බලපත්‍රය | 25 | 0 |
| දරමඩුවක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ... | 25 | 0 |
| තේ පෙට්ටි නිපදවීම සඳහා බලපත්‍රය— | | |
| (අ) බිම් ප්‍රමාණය වර්ග අඩි 500ට වැඩි නොවන විට ... | 100 | 0 |
| (ආ) බිම් ප්‍රමාණය වර්ග අඩි 500ට වැඩි වන විට ... | 200 | 0 |
| කම්මලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ... | 10 | 0 |
| පුද්ගලික ජලනල සේවයේ එක් එක් කරාමයකට මසකට බද්ද | 2 | 50 |
| **වෙන්දේසි හා බ්‍රෝකර් බලපත්‍රගාස්තු** | | |
| වෙන්දේසි හා බ්‍රෝකර් කරුවෙකු වශයෙන් ව්‍යාපාරයක් හෝ වෙළඳාමක් සඳහා ... ... | 40 | 0 |
| වෙන්දේසි කරුවෙකු වශයෙන් ව්‍යාපාරයක් හෝ වෙළඳාමක් සඳහා ... ... | 30 | 0 |
| බ්‍රෝකර් කරුවෙකු වශයෙන් ව්‍යාපාරයක් හෝ වෙළඳාමක් සඳහා ... ... | 30 | 0 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | | |
| අ. බ. 10 හා 20 අතර වූ වී මෝලක් හෝ ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය ... ... | 50 | 0 |
| අ. බ. 20ට අධිකවූ විට ... ... | 150 | 0 |
| යන්ත්‍රික බලය පාවිච්චි නොකර මෝටර් වාහන අලුත්වැඩියා කරණ හෝ වැඩට ගතහැකි පරිදි අළුත් වැඩියා කරණ ස්ථානයක් ... ... | 25 | 0 |

ඊ. ඩී. පියදස,
ගහපහළ ගම්සභාපති.

ගහපහළ ගම්සභා කායඹාලය,
ගල්ගෙඩියාව–ගම්පොල,
1972.12.31.

2–219—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## පානදුර නගර සභාව

### 1973 වර්ෂයේ වරිපනම් පොත්

පානදුර නගර සභාවේ 1973 වර්ෂයේ වරිපනම් පොත් දැනට සූදානම්ව ඇති බවත්, කායඹාලයීය වේලාවන් තුළදී පරීක්ෂාකර බැලීම සඳහා විවෘතව ඇති බවත්, නගර සභා ආඥා පනතේ (255 ජේදය) 166 වෙනි කාණ්ඩය සහ නාගරික සභා ආඥාපනතේ (252 ජේදය) 235 (1) සහ (2) වෙනි කාණ්ඩයන් යටතේ මෙයින් දන්වා සිටිනු ලැබේ.

වයිටස් ගුණතිලක,
සභාපති,
පානදුර නගර සභාව.

73.1.30 දින,
පානදුර නගර සභා කායඹාලයේදිය.

2–450—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## ජල භීතිකා රෝගය

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් පිළිබඳ "ජලභීතිකා ආඥා පනතේ" 11 වගන්තියේ ප්‍රකාර (476 පරිච්ඡේදය) හිඟුරක්ගොඩ සුළු නගර සභා සීමාව ඇතුළත පිහිටි—පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක නැතහොත් ගෙවත්තක නොවූ අන් ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬුවතේ යන නැතහොත් එක්කරගෙන යනු නොලබන යම් කිසි ශුනඛයෙකු (බල්ලෙකු) මා විසින් ලියවිල්ලකින් දෙන ලද බල පත්‍රයක් ලත් අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. **මෙම ප්‍රකාශණය 1973 පෙබරවාරි 1 දින සිට මාස හයක් වලංගු වන්නේය.**

ඩී. ආර්. අබේරත්න,
සභාපති,
හිඟුරක්ගොඩ සුළු නගර සභාව.

1973.01.24 වෙනි දින,
හිඟුරක්ගොඩ සුළු නගර සභා කායඹාලයේ දිය.

2–218—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

---

## කුංඩුච්චු කෝරළේ ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත (272 අධිකාරය)

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කුංචුච්චු කෝරළේ ගම් සභාවේ සභාපති වන මම 1973 වර්ෂයේදී පහත සඳහන් උප ලේඛනයෙහි දැක්වෙන දිනයන්හිදී කුංචුච්චු කෝරළේ ගම්සභා සීමාව තුළ මස් පිණිස සතුන් මැරීම හා මස් වෙළෙඳාම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

### උපලේඛනය

1973 පෙබරවාරි 16
1973 මාර්තු 4 සහ 18
1973 අප්‍රේල් 2 සහ 16
1973 මැයි 2, 16 සහ 31
1973 ජූනි 14 සහ 29
1973 ජූලි 14 සහ 29
1973 අගෝස්තු 13 සහ 27
1973 සැප්තැම්බර් 11 සහ 25
1973 ඔක්තෝබර් 4, 11 සහ 25
1973 නොවැම්බර් 9 සහ 23
1973 දෙසැම්බර් 9 සහ 23

යු. සිලම්බුරාල,
කුංචුච්චු කෝරළේ ගම්සභාපති.

කුංචුච්චු කෝරළේ ගම්සභා කාර්යාලය,
කැබිතිගොල්ලෑව,
1973.02.05.

2–703—73.02.15 දින අංක 47 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

**1973**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 73. 1. 5 සිකුරාද | ... | 72.12.29 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 1.12 සිකුරාද | ... | 73. 1. 5 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 1.19 සිකුරාද | ... | 73. 1.12 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 1.26 සිකුරාද | ... | 73. 1.19 සිකුරාද | දවල් 12.00 |
| පෙබරවාරි | ... | 73. 2. 2 සිකුරාද | ... | 73. 1.26 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 2. 9 සිකුරාද | ... | 73. 2.2 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 2.15 බ්‍රහස්පතින්ද | ... | 73. 2. 9 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 2.23 සිකුරාද | ... | 73. 2.15 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| මාර්තු | ... | 73. 3. 2 සිකුරාද | ... | 73. 2.23 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3. 9 සිකුරාද | ... | 73. 3. 2 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3.16 සිකුරාද | ... | 73. 3. 9 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3.23 සිකුරාද | ... | 73. 3.16 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 3.30 සිකුරාද | ... | 73. 3.23 සිකුරාද | දවල් 12.00 |
| අප්‍රේල් | ... | 73. 4. 6 සිකුරාද | ... | 73. 3.30 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 4.11 බදාද | ... | 73. 4. 6 සිකුරාද | දවල් 12.00 |
| | | 73. 4.19 බ්‍රහස්පතින්ද | ... | 73. 4.11 බදාද | දවල් 12.00 |
| | | 73. 4.27 සිකුරාද | ... | 73. 4. 19 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.